## නිපුණතාවය - මූලික පොත්වල ගණුදෙනු සටහන් කර ලෙජරයට පිටපත් කරයි.

## නිපුණතා මට්ටම - බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කරයි.

**පෙළපොතේ පිටු අංක 127 – 130 දක්වා හොඳින් කියවා පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

01) පහත දක්වා ඇත්තේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ අවසාන ශේෂය සහ බැංකු ප්‍රකාශනයේ අවසාන ශේෂය එකිනෙකට අසමාන වීමට බලපාන හේතු වේ. ඒවා සොයා ගත හැක්කේ බැංකු ගිණුම තුලින්ද බැංකු ප්‍රකාශනය තුලින්ද යන්න එක් හේතුව බැගින් ඉදිරියෙන් ලියා දක්වන්න.

a) බැංකුවට සෘජුවම ලැබී ඇති ණයගැති ප්‍රේෂණ
b) නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොකළ චෙක්පත්
c) බැංකුව අයකළ බැංකු ගාස්තු
d) තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත්
e) බැංකුව සිදු කළ ස්ථාවර නියෝග මත ගෙවීම්
f) බැංකු ගිණුමට අදාළ ආයෝජන ආදායම්

02) ඉහත දැක්වූ කරුණු අතරින් සංශෝධිත බැංකු ගිණුමේ සටහන් කළ යුතු කරුණු තෝරා දක්වන්න.

03) ඉහත ඔබ දැක්වූ කරුණු සංශෝධිත බැංකු ගිණුමේ සටහන් කළ යුත්තේ හර පැත්තේද, බැර පැත්තේද යන්න වර්ග කර දක්වන්න.

04) ඉහත 01 හි දක්වා ඇති කරුණු අතරින් සංශෝධිත බැංකු ගිණුම සකස් කිරීමෙන් පසු බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීමට යොදා ගන්නා කරුණු සොයා නම් කරන්න.

05) ඉහත 04 හි පිළිතුරු ලෙස ඔබ සොයා ගත් කරුණු යොදා ගනිමින් සංශෝධිත බැංකු ගිණුමේ අවසාන ශේෂයෙන් ආරම්භ කර බැංකු ප්‍රකාශනයේ ශේෂය සොයා ගැනීමට හැකි වන සේ බැංකු සැසඳුස් ප්‍රකාශනයක ආකෘතියක් පිළියෙල කරන්න.

06) ඔබගේ පෙළපොතේ පිටු අංක 130 -132 දක්වා ඇති ක්‍රියාකාරකම් 03, 04 සහ 05 යන අභ්‍යාස වල නිරත වන්න.